# භූගෝල විද්‍යාව

# 6 ශ්‍රේණිය

## ගුරු මාර්ගෝපදේශය
(2015 සිට ක්‍රියාත්මක වේ)



සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

# භූගෝල විද්‍යාව

## ගුරු මාර්ගෝපදේශය

## 6 ශ්‍රේණිය

**(2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)**

සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk          විද්‍යුත් තැපැල : info@nie.lk

# භූගෝල විද්‍යාව

**6 ශ්‍රේණිය**

**ගුරු මාර්ගෝපදේශය**

**ප්‍රථම මුද්‍රණය 2014**

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN

සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය,
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

**වෙබ් අඩවිය** : www.nie.lk
**විද්‍යුත් තැපැල** : info@nie.lk

*මුද්‍රණය* : මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මගින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිතව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2015 වර්ෂයේ දී හයවන සහ දහවන ශ්‍රේණි සඳහා හඳුන්වාදීම කළ යුතුව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනාවන් ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය. මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලුම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූලව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එකම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම් වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍යවන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතාවයන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන්ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එමනිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායීවීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමඟ සමගාමීව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම තුළින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය. මම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලුම සම්පත්දායකයින් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.


*අධ්‍යක්ෂ ජනරාල්*
*ජාතික අධ්‍යාපන ආයතනය*

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල: info@nie.lk

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පතකරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවයෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රම වේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂයමාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශය නිර්මාණය වේ.

විෂයහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයෙ ්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙ හි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයාට ද දෙගුරුනට ද භාවිත කළ හැකිය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් පෙළ පොත හා ගුරු මාර්ගෝපදේශය යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය.

# විෂයමාලා කමිටුව

| | |
|---|---|
| **උපදේශකත්වය හා අනුමැතිය** | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය,<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **විෂය සම්බන්ධීකරණය** | එම්. පී. රංජනී ධනවර්ධන<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව |

## ලේඛක මණ්ඩලය

**බාහිර සම්පත් දායකත්වය**

| | |
|---|---|
| මහාචාර්ය එම්. එම්. කරුණානායක | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| මහාචාර්ය එන්. කේ. දංගල්ල | කැළණිය විශ්වවිද්‍යාලය |
| නන්දනී රූපසිංහ | නියෝජ්‍ය ප්‍රකාශන කොමසාරිස්,<br>අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව |
| ආර්. ජී. පීරිස් | (විශ්‍රාමික) නියෝජ්‍ය විභාග කොමසාරිස් |
| එස්. එම්. දයානන්ද | (විශ්‍රාමික) ව්‍යාපෘති නිලධාරි, ජාතික අධ්‍යාපන ආයතනය |
| එම්. කේ. කිංස්ලි ප්‍රියන්ත | කථිකාචාර්ය, රුහුණු ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය. |
| එම්.එච්.එම්. යාකුත් | (විශ්‍රාමික) ප්‍රධාන ව්‍යාපෘති නිලධාරි, ජාතික අධ්‍යාපන ආයතනය |
| ඊ. එම්. නවරත්න බණ්ඩා | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය,<br>ගලෙන්බිඳුණුවැව. |
| ජේ. ඒ. බී. හීන්කෙන්ද | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය,<br>මහනුවර |
| වනිතා වල්පිටගේ | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය,<br>හොරණ |
| සුමිත්‍රා නන්දනී | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය,<br>පිළියන්දල. |
| බී. සරස්වතී | ගුරු උපදේශක, බණ්ඩාරවෙල ක. අ. කාර්යාලය |
| ඒ. දේවගී | ගුරු උපදේශක, හල්දුම්මුල්ල කො. අ. කාර්යාලය |
| කේ. කේ. යූ. ගුණරත්න | ගුරු සේවය, පොල්පාගොඩ නවෝදයා පාසල,<br>යක්කලමුල්ල. |
| ජී.ඩබ්ලිව්. ජී. ජේ. බණ්ඩාර | ගුරු සේවය, මාහාමාත්‍ය විද්‍යාලයය, අතුරුගිරිය. |
| එල්. ආර්. ආර්. සිල්වා | නියෝජ්‍ය විදුහල්පති,<br>ශාන්ත අන්තෝනි ජාතික පාසල, වත්තල |

**අභ්‍යන්තර සම්පත් දායකත්වය**

| | |
|---|---|
| එම්. පී. රංජනී ධනවර්ධන | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව. |
| එස්. කරුණාකරන් | කථිකාචාර්ය,<br>සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව. |
| කේ. ඒ. එල්. ගීතානි | කථිකාචාර්ය, උපදේශන අංශය |

**භාෂා සංස්කරණය**

| | |
|---|---|
| එච්. පී. සුසිල් සිරිසේන මයා | කථිකාචාර්ය, හාපිටිගම් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය,<br>මීරිගම |

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

මෙම ගුරු මාර්ගෝපදේශය සෑම විෂය ඒකකයක් සඳහා ම අන්තර්ගතය, ඉගෙනුම් පල හා ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේද, තක්සේරු හා ඇගයීම් නිර්ණායක කිහිපයක් ද ඉදිරිපත් කර ඇත. සෑම නිපුණතා මට්ටමකට ම අදාළ ව ඉදිරිපත් කර ඇති ඉගෙනුම් පල කෙරෙහි විශේෂ අවධානය යොමුකර අත්‍යවශ්‍යයෙන් ම ඉගැන්විය යුතු විෂය සීමා තේරුම් ගැනීම කළ යුතු ය. එම විෂය සීමාවලින් ඔබ්බට අවශ්‍ය කරුණු සොයා ගැනීමට සිසුන් පෙළඹවීම ගුරුවරයා විසින් සිදු කළ යුතු ය.

ඉදිරිපත් කර ඇති ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේද ඒ ඒ නිපුණතා මට්ටමට, විෂය අන්තර්ගතයට හා පන්ති කාමරයේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාවට, කාලයට හා දැනුමට උචිත පරිදි නිර්මාණශීලී ව ගොඩනගා ගත යුතු ය. මීට අමතර ව වෙනත් විධියක සුදුසු ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේද හඳුනාගෙන නිපුණතා මට්ටමට උචිත පරිදි සැලසුම් කර ගැනීම සඳහා ඔබට පූර්ණ නිදහස ඇත. මෙම ක්‍රමවේද සැලසුම් කිරීමේ දී සිසුන්ට ප්‍රියජනක, ක්‍රියාකාරී ඉගෙනුම් අත්දැකීම් ලබා ගැනීමට හැකිවන පරිදි සකසා ගැනීම වඩාත් සුදුසු ය.

ගුරුවරයා විසින් සැලසුම් කරන ලද පාඩමට අදාළ ව ගුණාත්මක යෙදවුම් භාවිත කළ යුතු ය. පොදුවේ භූගෝල විද්‍යා විෂය සඳහා යොදාගත හැකි ගුණාත්මක යෙදවුම් ලෙස ආදර්ශ ලෝකගෝලය, බිත්ති සිතියම් (ලංකා/ලෝක) ඇට්ලස් සිතියම් පොත්, පෙළපොත, තොරතුරු පත්‍රිකා වැනි මූලාශ්‍රයන් හැඳින්විය හැකි ය. මීට අමතර ව ඔබ සකස් කර ගන්නා පාඩමට අදාළ ව උචිත ගුණාත්මක යෙදවුම් ඒ ඒ අවස්ථාවල දී සුවිශේෂී ව යොදා ගැනීම කළ හැකි ය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය මගින් අපේක්ෂිත ඉගෙනුම් පල සිසුන් විසින් සාක්ෂාත්කර ගත් බව තහවුරු කරගැනීම සඳහාත්, සිසුන් ළඟාකරගත් ප්‍රවීණතා මට්ටම හඳුනා ගැනීම සඳහාත් පහසුවෙන් යොදා ගත හැකි වැඩපිළිවෙළ තක්සේරුව හා ඇගයීම ලෙස හඳුන්වා දිය හැකි ය. ශිෂ්‍ය ප්‍රබලතා හා දුබලතා හඳුනාගෙන, දුබලතා ඇති අයගේ ගැටලු මගහරවා ගැනීමටත්, ප්‍රබලතා වැඩිදියුණු කිරීමටත් ගුරුවරයාට එමගින් හැකියාව ලැබෙයි. ඒ අනුව යොදාගත හැකි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට අදාළ ව නිර්ණායක පහක් හඳුනාගෙන තක්සේරුව හා ඇගයීම සිදු කළ යුතු ය.

පන්තියට අදාළ පෙළපොත එක් මූලාශ්‍රයක් පමණි. ඊට අමතර ව වෙනත් මූලාශ්‍ර ද ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා යොදා ගැනීම ඉතා වැදගත් ය. ප්‍රායෝගික අත්දැකීම් ලැබෙන සේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලි සංවිධානය කර ගැනීමෙන් අපේක්ෂිත නිපුණතා මට්ටම කරා සිසුන් ගෙන යා හැකි වේ.

විෂය නිර්දේශයේ අන්තර්ගත කරුණු හා විෂය සංකල්ප වඩා සාර්ථක ඉගෙනුම් අත්දැකීම් බවට පත්කිරීම සඳහා සෑම ශිෂ්‍යයකුට ම සහභාගි විය හැකි වැඩසටහන් සම්පාදනය කිරීම පාසල් කළමනාකාරීත්වයේ වගකීමක් කොට සැලකේ. පහත දැක්වෙන්නේ භූගෝල විද්‍යාව විෂයට අදාළ ව පාසල තුළ ක්‍රියාත්මක කළ හැකි වැඩසටහන් කිහිපයකි.

- භූගෝල විද්‍යා සංගමයක් පිහිටුවීම

  මෙමගින් දැනුම මිනුම වැඩසටහන්, විවාද, ප්‍රදර්ශන, අධ්‍යාපන චාරිකා සංවිධානය, සම්මන්ත්‍රණ, සිසුන් මෙහෙයවන බුද්ධි මණ්ඩල සාකච්ඡා, ශ්‍රමදාන, බිත්ති පුවත්පත් හා වාර ප්‍රකාශන වැනි විවිධ කාර්යයන් සඳහා සිසුන් යොමු කළ හැකිය. එසේම විෂය සම්බන්ධ ව ඇති ගැටලු නිරාකරණයට, විෂය හා සම්බන්ධ වූ ගුරු, සිසු පිරිස හඳුනා ගැනීමට හා සිසු දක්ෂතා හඳුනා ගැනීමට ද අවස්ථාව ලැබේ.

- භූගෝල විද්‍යා කාමරයක් සැකසීම

  මෙය සිසුන්ගේ දැනුම වර්ධනයට මෙන්ම විෂය පිළිබඳ සිසුන් තුළ අභිමානවත් හැඟීමක් ඇති කිරීමට ඉතා ප්‍රයෝජනවත් ය. විෂයට අදාළ විවිධ ප්‍රකාශන, සිතියම්, ඉගෙනුම් උපකරණ පරිහරණයට මෙමගින් අවස්ථාව ලැබේ. අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක ඊඩී/01/05/02/02/55AL, 2012/05/10 දිනැති ලිපිය බලන්න.

- කුඩා ප්‍රමාණයේ පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

  සම්පත් පුද්ගලයින්, විෂයට අදාළ තොරතුරු ලබාගත හැකි ආයතන, මුද්‍රිත හා විද්‍යුත් මූලාශ්‍ර ආදිය යොදා ගෙන විවිධ වාර්තා සැකසීමට හා ඉදිරිපත් කිරීමට පෙලඹවීම

- භූගෝල විද්‍යා විෂයට අදාළ වැඩමුළු හා සම්මන්ත්‍රණ පැවැත්වීම

- පරිසර සංවේදීතාව සිසුන් තුළ වර්ධනය කිරීමට උපකාරීවන වැඩසටහන් සංවිධානය කිරීම
  * ප්‍රදේශයේ පවතින පාරිසරික සංවිධාන සමඟ එක් ව කටයුතු කිරීමට සිසුන් දිරිගැන්වීම
  * කෘෂි වනවගා ව්‍යාපෘති
  * පාසල් හරිත තීරය හා ඖෂධ උයන් වගාව
  * පාසල් පරිසර නියමු භට කණ්ඩායම් පිහිටුවීම
  * පරිසර සංවේදී පාසල් නාට්‍ය නිර්මාණය කිරීම
  * පරිසර හිතකාමී භාණ්ඩ පරිහරණයට යොමු කිරීම

- සිසු නිර්මාණ හා ක්ෂේත්‍ර සටහන් පොත් සඳහා වර්ණ හා ත්‍යාග ප්‍රදානය කිරීම

- භූගෝල විද්‍යා විෂයට අදාළ ආකෘති උපකරණ නිර්මාණය කිරීමේ අවස්ථා ඇති කිරීම

- විද්‍යුත් මාධ්‍ය උපයෝගීකර ගනිමින් විෂය දැනුම වර්ධනය කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කිරීම
  * CD/ DVD තැටි
  * පරිගණක වැඩසටහන්
  * රූපවාහිනී වැඩසටහන්

**විෂයමාලා කමිටුව**

# පටුන


| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය | iv |
| විෂයමාලා කමිටුව | v |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | vi - vii |
| පටුන | viii |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | ix - xxii |
| ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | |
| 1 ඒකකය | 01 - 06 |
| 2 ඒකකය | 07 - 12 |
| 3 ඒකකය | 13 - 17 |
| 4 ඒකකය | 18 - 19 |
| විවිධ සහාය | 20 |

# භූගෝල විද්‍යාව

## විෂය නිර්දේශය

## 6 ශ්‍රේණිය

**(2015 සිට ක්‍රියාත්මක වේ)**

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
www.nie.lk

# හැඳින්වීම

භූගෝල විද්‍යාව ජීව ලෝකයෙහි ගතිකත්වය ග්‍රහණය කර ගැනීමට උපකාරී වන ශික්ෂණයකි. කාලය හා අවකාශීය මාන තුළ අන්‍යොන්‍ය වශයෙන් ක්‍රියාකාරී වන භෞතික හා මානුෂ සංසිද්ධීන්හි සංශ්‍රෘහිත ප්‍රකාශනය වන භූ දර්ශනය තුළ මෙම ගතිකත්වය ගැබ් ව පවතී. එහෙයින්, භූගෝල විද්‍යාව යනු අවකාශීය හා කාලික පර්යාලෝකයකින් ස්ථානීය මට්ටමේ සිට ගෝලීය මට්ටම දක්වා වූ පරාසයක විහිදෙන පාරිසරික හා සාමාජීය ක්‍රියාවලි ද, ඒවා අතර පවත්නා සම්බන්ධතා ද කෙරෙහි අවධානය යොමු කරන ශික්ෂණයකි. පාසල් භූගෝල විද්‍යාව පිළිබඳ මෙම විෂයමාලාව සකස් කර ඇත්තේ ඉහතින් විස්තර කළ එම සන්දර්භ තුළ ය.

වර්ෂ 2015 සිට ක්‍රියාත්මක වීමට යෝජිත මෙම විෂයමාලාව සකස් කිරීමේ දී පසුගිය පස් වසර තුළ ක්‍රියාත්මක වූ භූගෝල විද්‍යා විෂයමාලාව පිළිබඳ ව කළ පර්යේෂණවල සොයාගැනීම් ද පන්ති කාමරය තුළ කළ නිරීක්ෂණ හා ගුරු - සිසු අත්දැකීම් ද සැලකිල්ලට ගනු ලැබිණ. යෝජිත විෂයමාලාව, සිසුන් තුළ දැනුම, අවබෝධය, කුසලතා හා ආකල්ප වර්ධනය කිරීමට ද විශේෂයෙන් ම, අවස්ථා ග්‍රහණය කර ගැනීමේ සහ විවිධ සංවර්ධන විකල්පයන්හි බලපෑම් තක්සේරු කිරීමේ හැකියාව වර්ධනය කිරීමට ද ආධාර වනු ඇත. එසේම, කෙටි කාලයේ දී මෙන් ම දීර්ඝ කාලීන ව ද, චිරස්ථායිතාව ප්‍රවර්ධනය කිරීමට උපකාරී වන සම්පත් කළමනාකරණය පිළිබඳ ව නිවැරදි දැක්මක් ලබා දීමට ද මෙම විෂයමාලාවෙන් අපේක්ෂා කෙරේ. තවද, පාරිසරික මූලධර්ම පදනම් කර ගෙන සමාජ - පාරිසරික අන්තර් සම්බන්ධතා පැහැදිලි කිරීමේ හැකියාව වර්ධනය කිරීමට ද අපේක්ෂිත ය.

විෂය නිර්දේශ සකස් කර ඇත්තේ භූගෝල විද්‍යා විෂයට අදාළ නිපුණතා දහය හා අරමුණු හත පදනම් කර ශිෂ්‍යයාගේ වයස සහ ඉගෙනීමේ ශක්‍යතාව අනුව වෙනස් වන නිපුණතා මට්ටම් කෙරෙහි සැලකිලිමත් වෙමිනි. තොරතුරු හා නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුරුවරයා විසින් අන්තර් - ක්‍රියාකාරී ඉගැන්වීම් ක්‍රමවේද භාවිත කරමින් පරිණාමන ගුරු භූමිකාවක් ඉටු කරනු ලැබීම අපේක්ෂා කෙරේ.

වර්ෂ 2015 දී ක්‍රියාත්මක කිරීමට යෝජිත මෙම විෂයමාලාව, ජ්‍යෙෂ්ඨ විශ්වවිද්‍යාල ආචාර්යවරු, ජාතික අධ්‍යාපන ආයතනයෙහි භූගෝල විද්‍යා විෂයමාලා සංවර්ධන කණ්ඩායමේ සාමාජිකයින්, අධ්‍යාපනඥයන් හා ගුරුභවතුන්ගෙන් සැදුම් ලත් කණ්ඩායමක සාමූහික ප්‍රයත්නයකි. මෙම විෂය නිර්දේශ සකස් කිරීමේ දී භූගෝල විද්‍යාව විෂයට අදාළ ප්‍රධාන නිපුණතා දහය පදනම් කරගෙන ඇති අතර එය පහත දැක්වේ.

1. තමා ජීවත්වන පරිසරයේ ස්වභාවය හා ක්‍රියාවලි පිළිබඳ අවබෝධයෙන් ජීවත් වෙයි.

2. භෞතික හා මානුෂ භූ දර්ශන තේරුම් ගැනීමට උපකාරීවන මූලික සංකල්ප සහ ක්‍රමවේද විමර්ශනය කරයි.

3. භෞතික, මානුෂ භූ දර්ශනයේ සංරචක, ගති ලක්ෂණ හා ක්‍රියාවලි පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

4. භෞතික හා මානුෂ ක්‍රියාවලීන්ගේ අන්තර්ක්‍රියා භූගෝලීය පරිසරය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

5. දත්ත හා තොරතුරු රැස්කිරීම, විශ්ලේෂණය කිරීම, අර්ථනිරූපණය හා ඉදිරිපත් කිරීම සඳහා භූගෝල විද්‍යාවේ ක්‍රම ශිල්ප භාවිත කරයි.

6. භෞතික හා මානුෂ භූ දර්ශන තේරුම් ගැනීම, විශ්ලේෂණය හා අර්ථකථනය කිරීම සඳහා සාකල්‍ය ප්‍රවේශය යොදා ගනියි.

7. භෞතික හා මානුෂ භූ දර්ශනය සංරක්ෂණය කිරීමට හා පවත්වා ගැනීමට උපකාරී වන ආකල්ප සහිත ව සංවේදී ව හැසිරෙයි.

8. ස්වභාව ධර්මය හා සමාජය අතර සුසංයෝගී අන්තර් සම්බන්ධතාව ප්‍රවර්ධනය කිරීම සඳහා පෘථිවිය හා එහි වැසියන් පිළිබඳ මනා අවධානයකින් කටයුතු කරයි.

9. ජීවිතයේ අභියෝගාත්මක අවස්ථා ජය ගැනීමට උපකාරී වන සුවිශේෂී දිවිරැකුම් කුසලතා භාවිත කරයි.

10. වැඩ ලෝකයට සක්‍රිය ලෙස සහභාගීවීමට අවශ්‍ය හුරුව ලබයි.

ඇ.

# ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතා සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

i. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩ ගැනීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම.

ii. වෙනස් වන ලෝකයක අභියෝගවලට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

iii. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මත සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

iv. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

v. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

vi. පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

vii. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවලට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

viii. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම (උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත.

i **සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපණ භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්‍ෂණ ප්‍රවීණතාව** : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රයක් තුළ දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගි කර ගැනීම

ii. **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා ;
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

i. **පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය** : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් - වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

**භෞතික පරිසරය :** අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව,ආහාර, ඇඳුම්, නිවාස,සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

iv. **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
- හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම, සහ වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම

යන හැකියා උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

v. **ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා**



පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවලට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

vi. **ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටා තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

vii. **"ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත්,ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම. *(උපුටා ගැනීම : 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)*

# භූගෝල විද්‍යා විෂයයේ අරමුණු

1. භෞතික හා මානුෂ භූ දර්ශනයේ සංරචක, ගතිලක්ෂණ හා ක්‍රියාවලි පිළිබඳ අවබෝධයෙන් ක්‍රියා කිරීම.
2. ස්වභාවධර්මය හා සමාජය අතර ඇති අන්තර් සම්බන්ධතා සහ ඒවායේ රටා හා ක්‍රියාවලි අවකාශීය හා කාලික යථාදර්ශයකින් අධ්‍යයනය කිරීම.
3. දත්ත හා තොරතුරු රැස්කිරීම, විශ්ලේෂණය කිරීම, අර්ථ නිරූපණය හා ඉදිරිපත් කිරීම සඳහා භූගෝල විද්‍යාත්මක ක්‍රමශිල්ප භාවිතයට හුරුවීම.
4. තමා ජීවත්වන ලෝකයේ විවිධත්වය තේරුම් ගෙන එකිනෙකා සමගත්, පරිසරය සමගත් සුසංයෝගී ව ජීවත් වීමට හුරු වීම.
5. භෞතික හා මානුෂ භූ දර්ශනය සංරක්ෂණය කිරීම හා පවත්වා ගැනීමට උපකාරී වන ධනාත්මක ආකල්ප වර්ධනය කර ගැනීම.
6. ජීවිතයේ අභියෝගාත්මක අවස්ථා ජය ගැනීමට උපකාරීවන සුවිශේෂී දිවිරැකුම් කුසලතා වර්ධනය කර ගැනීම.
7. වැඩ ලෝකයට සක්‍රීය ලෙස සහභාගීවීමට අවශ්‍ය කුසලතා වර්ධනය කිරීම.

| නිපුණතාව | විෂය නිපුණතා හා නිපුණතා මට්ටම් | අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **තමා ජීවත්වන පරිසරයේ ස්වභාවය හා ක්‍රියාවලි පිළිබඳ අවබෝධයෙන් ජීවත් වෙයි.** | 6.1.1 තම පාසල හා අවට වටපිටාව පිළිබඳ තොරතුරු රැස්කර ඉදිරිපත් කරයි. | 6.1.1 පාසල හා අවට වටපිටාවේ අන්තර් සම්බන්ධතාව<br>• පිහිටීම<br>* ග්‍රාම නිලධාරී කොට්ඨාසය<br>* ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය<br>* දිස්ත්‍රික්කය<br>* පළාත<br>✶ ශ්‍රී ලංකා දිස්ත්‍රික් ආකෘති සිතියමක පාසලේ පිහිටීම ලකුණු කිරීම<br>• ඉඩමේ හැඩය (පාසලේ සිතියම ඇසුරින්)<br>• පාසලේ සිට තෝරාගත් ස්ථාන පිහිටි දිශාව හා දුර (පාසලේ සිට නිර්ණය කරගත හැකි පොදු ස්ථාන කිහිපයක් තෝරා ගන්න. | • පාසල පිහිටි පරිපාලන කොට්ඨාස ධූරාවලි නම් කරයි.<br>• ශ්‍රී ලංකා ආකෘති සිතියමක පාසලේ පිහිටීම ලකුණු කරයි.<br>• පාසල පිහිටීම දක්වන පරිපාලන ධූරාවලියේ අන්තර් සම්බන්ධතාව පැහැදිළි කරයි.<br>• පාසල පිහිටි භූමියේ සැලැස්ම ඇඳ ඉඩමේ හැඩය ඉදිරිපත් කරයි.<br>• තෝරාගත් වැදගත් ස්ථාන කිහිපයකට පාසලේ සිට ඇති දිශාව හා දුර දක්වන වගුවක් සකස් කරයි. | 18 |
| **භෞතික හා මානුෂ භූ දර්ශනයේ සංරචක, ගතිලක්ෂණ හා ක්‍රියාවලි පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.** | 6.1.2 පාසල අවට වටපිටාවේ කාලගුණික ස්වභාවය විස්තර කරයි. | 6.1.2 පාසල අවට වටපිටාවේ කාලගුණයේ ස්වභාවය<br>• උෂ්ණත්වය | • කාලගුණය යන්න අර්ථ දක්වයි<br>• කාලගුණික අංග නම් කරයි.<br>• උෂ්ණත්වමානයක් භාවිත කර උෂ්ණත්වය සටහන් කරයි. | |

| නිපුණතාව | විෂය නිපුණතා හා නිපුණතා මට්ටම් | අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | • වර්ෂාපතනය<br>• සුළං<br>• වලාකුළු<br>සරල උපකරණ සහ නිරීක්ෂණ ඇසුරින් තොරතුරු රැස්කර කාලගුණය පිළිබඳ විස්තර කිරීම | • වර්ෂාපතනය මැනීම සඳහාත්, සුළඟේ දිශාව හඳුනා ගැනීම සඳහාත් සුදුසු සරල උපකරණ නිර්මාණය කරයි.<br>• වර්ෂාමානයක් භාවිත කර වර්ෂාපතනය මැන සටහන් කරයි.<br>• සුළං දිශා දර්ශකයක් භාවිතයෙන් සුළං හමන දිශාව ප්‍රකාශ කරයි.<br>• අහස නිරීක්ෂණය කර වලා වැස්ම පිළිබඳ සටහන් තබා ගනියි.<br>• සුවිශේෂ කාලගුණික සංසිද්ධීන් පිළිබඳ තොරතුරු ප්‍රකාශ කරයි.<br>• පාසල අවට වටපිටාවේ දෛනික කාලගුණය පිළිබඳ ප්‍රකාශ ඉදිරිපත් කරයි. | |
| **දත්ත හා තොරතුරු රැස්කිරීම, විශ්ලේෂණය කිරීම, අර්ථ නිරූපණය හා ඉදිරිපත් කිරීම සඳහා භූගෝල විද්‍යාවේ ක්‍රම ශිල්ප භාවිත කරයි.** | 6.1.3 පාසල අවට වටපිටාවේ භූ දර්ශනයෙහි කටු සිතියමක් නිර්මාණය කරයි. | 6.1.3 පාසල අවට වටපිටාවේ භූ දර්ශනයේ කටු සිතියම<br>• භූමියේ ස්වභාවය<br>• ගංගා ඇළ දොළ<br>• වගා බිම්<br>• මාර්ග, මංසන්ධි<br>• පොදු ගොඩනැගිලි | • පාසල අවට භූ දර්ශනය චිත්‍රයට නගයි.<br>• පාසල අවට වටපිටාවේ භූ දර්ශනය විස්තර කරයි.<br>• පාසල අවට භූ දර්ශනයේ සම්බන්ධතාව දළ සැලැස්මකින් පෙන්වයි.<br>• පාසල අවට භූ දර්ශනය හඳුනාගෙන එහි ඇති සරල හෝ සංකීර්ණ බව පැහැදිලි කරයි. | |

| නිපුණතාව | විෂය නිපුණතා හා නිපුණතා මට්ටම් | අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **තමා ජීවත්වන පරිසරයේ ස්වභාවය හා ක්‍රියාවලි පිළිබඳ අවබෝධයෙන් ජීවත් වෙයි.** | 6.2.1 නිවස අවට වටපිටාවේ භූමියේ ස්වභාවය හා විවිධත්වය පැහැදිලි කරයි. | 6.2.1 නිවස අවට වටපිටාවේ භූමියේ ස්වභාවය<br>• උස්බිම්<br>• බෑවුම්<br>• තැනිතලා<br>• ගංගා සහ ඇළ දොළ<br>• වැව්/ජලාශ<br>• වෙරළ තීරය | • තම නිවෙස් අවට වටපිටාවේ භූ ලක්ෂණ හඳුනා ගනියි.<br>• තම නිවෙස් අවට වටපිටාවේ භූමියේ විවිධත්වය පැහැදිලි කරයි.<br>• නිවෙස් අවට වටපිටාවේ මතුපිට ස්වරූපය ආකෘති මගින් ඉදිරිපත් කරයි.<br>• සිසුන් තම නිවෙස් පිහිටි වටපිටාව එකිනෙකාගෙන් වෙනස් බව අවබෝධයෙන් විස්තර කරයි. | 18 |
| **භෞතික හා මානුෂ ක්‍රියාවලීන්ගේ අන්තර්ක්‍රියා භූගෝලීය පරිසරය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.** | 6.2.2 නිවස අවට වටපිටාවේ ශාක හා සතුන් පිළිබඳ නිරීක්ෂණ කර විවිධත්වය පැහැදිලි කරයි. | 6.2.2 නිවස අවට වටපිටාවේ ශාක හා සත්ත්ව විවිධත්වය<br>• ශාක<br>• සත්වයින් | • තම නිවස අවට වටපිටාවේ දක්නට ලැබෙන ශාක හා සත්ත්ව වර්ග හඳුනා ගනියි.<br>• නිවස අවට වටපිටාවේ ශාක හා සත්ත්ව වර්ගවල ප්‍රයෝජන ඇතුළත් වගුවක් සකස් කරයි.<br>• සත්ව හා ශාක පද්ධතියට මිනිසාගෙන් සිදුවන බලපෑම් විස්තර කරයි.<br>• ශාක හා සත්ත්ව විවිධත්වය රැක ගැනීමේ වැදගත්කම විස්තර කරයි. | |

| නිපුණතාව | විෂය නිපුණතා හා නිපුණතා මට්ටම් | අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **භෞතික හා මානුෂ භූ දර්ශනයේ සංරචක, ගතිලක්ෂණ හා ක්‍රියාවලි පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.** | 6.2.3 පාසල/නිවස අවට වටපිටාවේ මානව ප්‍රජාවගේ ක්‍රියාකාරකම්වල ස්වභාවය පැහැදිලි කරයි. | 6.2.3 පාසල/නිවස අවට වටපිටාවේ මානව ප්‍රජාවගේ ක්‍රියාකාරකම්<br>• පාසල/නිවස අවට ප්‍රජාව හඳුනා ගැනීම. ජන වර්ග හා ආගම් අනුව (විවිධත්වය තුළ සහයෝගී ව කටයුතු කිරීම)<br>• පාසල/නිවස අවට ආර්ථික කටයුතු<br>• කෘෂිකාර්මික කටයුතු<br>• කර්මාන්ත වර්ග<br>• සේවා කටයුතු | • පාසල අවට ප්‍රජාව පිළිබඳ ව තොරතුරු රැස් කරයි.<br>• නිවස අවට ප්‍රජාව සාමූහික ව කටයුතු කිරීමේ වැදගත්කම නිදසුන් ඇසුරින් පැහැදිලි කරයි.<br>• තම නිවස අවට වටපිටාවේ මිනිසුන්ගේ කෘෂිකාර්මික ආර්ථික කටයුතුවල විවිධත්වය පැහැදිලි කරයි.<br>• තම පාසල අවට ප්‍රදේශයේ ඇති කර්මාන්ත වර්ග හඳුනාගෙන එහි ස්වභාවය විස්තර කරයි.<br>• තම නිවස අවට වටපිටාවේ දක්නට ලැබෙන සේවා සපයන ආයතන හා පුද්ගලයින් සටහන් ඇසුරින් පෙන්වා දෙයි. | |
| **භෞතික හා මානුෂ භූ දර්ශනය සංරක්ෂණය කිරීමට හා පවත්වා ගැනීමට උපකාරී වන ධනාත්මක ආකල්ප සහිතව සංවේදී ව හැසිරෙයි.** | 6.3.1 තම නිවස හා අවට වටපිටාව යහපත්ව පවත්වා ගැනීමට කටයුතු කරයි. | 6.3.1 තම නිවස සහ අවට වටපිටාව යහපත් ව පවත්වා ගැනීම.<br>• භූමිය - විධිමත් ව භූමිය භාවිත කිරීම | • මිනිසා භූමිය ප්‍රයෝජනයට ගන්නා අවස්ථා විස්තර කරයි.<br>• අවිධිමත් භූමි පරිහරණ ආශ්‍රිත ගැටලු ඉදිරිපත් කරයි.<br>• භූමිය විධිමත් ව භාවිත කිරීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග විස්තර කරයි. | 14 |

| නිපුණතාව | විෂය නිපුණතා හා නිපුණතා මට්ටම් | අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | • ජලය – අරපිරිමැස්මෙන් භාවිතය, දූෂණය හා අපතේ හැරීමෙන් වැළකීම<br>• වාතය – දූෂණය වීමෙන් වළක්වා ගැනීම<br>• බලශක්තිය – අරපිරිමැස්මෙන් භාවිතය හා අනිසි භාවිතය වැළැක්වීම | • ජලයෙන් ලැබෙන ප්‍රයෝජන ලැයිස්තුගත කරයි.<br>• ජලය අරපිරිමැස්මෙන් භාවිත කිරීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග විස්තර කරයි.<br>• ජලය සපයනු ලබන මූලාශ්‍රය වල වැදගත්කම ප්‍රකාශ කරයි.<br>• පානීය ජලය නිසි පරිදි ප්‍රයෝජනයට ගතයුතු බව අවධාරණය කරයි.<br>• වාතය දූෂණය වන ක්‍රම සඳහන් කරමින් ඒවා වළක්වා ගැනීමට ගත හැකි පියවර විස්තර කරයි.<br>• බලශක්ති සංරක්ෂණය සඳහා අනුගමනය කළ හැකි ක්‍රමෝපා විස්තර කරයි. | |
| **භෞතික හා මානුෂ හූ දර්ශනය සංරක්ෂණය කිරීමට හා පවත්වා ගැනීමට උපකාරී වන ධනාත්මක ආකල්ප සහිත ව සංවේදී ව හැසිරෙයි.** | 6.3.2 ප්‍රයෝජනවත් ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමෝපායයන් අනුගමනය කරයි. | 6.3.2 අපද්‍රව්‍ය බැහැර කිරීම<br>• ගෘහස්ථ අපද්‍රව්‍ය<br>• කෘෂිකාර්මික අපද්‍රව්‍ය<br>• කාර්මික අපද්‍රව්‍ය ප්‍රයෝජනයට ගත හැකි ක්‍රම හා පරිසරයට හානියක් නොවන පරිදි බැහැර කිරීම | • ගෘහස්ථ, කාර්මික හා කෘෂිකාර්මික අපද්‍රව්‍ය යන ඒවා පැහැදිලි කරයි.<br>• නිවසේ ඇති අපද්‍රව්‍ය දෙන ලද වර්ගීකරණයකට අනුව වර්ග කර දක්වයි.<br>• අපද්‍රව්‍ය බැහැර කිරීමේ නිවැරදි ක්‍රම දැන ප්‍රකාශ කරයි.<br>• අපද්‍රව්‍ය අනිසි ලෙස බැහැර කිරීමෙන් පරිසරයට සිදුවන හානි විස්තර කරයි.<br>• අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීමේ ප්‍රයෝජන පැහැදිලි කරයි.<br>• අපද්‍රව්‍ය සම්පතක් ලෙස භාවිත කරන ආකාරය විස්තර කරයි. | |

| නිපුණතාව | විෂය නිපුණතා හා නිපුණතා මට්ටම් | අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| **භෞතික හා මානුෂ භූ දර්ශන තේරුම් ගැනීමට උපකාරී වන මූලික සංකල්ප සහ ක්‍රමවේද විමර්ශනය කරයි.** | 6.4.1 ලෝක සිතියමක් ඇසුරින් ශ්‍රී ලංකාවේ පිහිටීම හඳුනා ගෙන එහි ස්වභාවය විස්තර කරයි. | 6.4.1 ශ්‍රී ලංකාවේ පිහිටීම<br>• දූපතක් වශයෙන් පිහිටීම<br>• ඉන්දියන් සාගරයේ අනෙකුත් රටවලට සාපේක්ෂ ව ශ්‍රී ලංකාවේ පිහිටීම | • දූපතක් යන්න අර්ථ දක්වයි.<br>• ශ්‍රී ලංකාවේ ඉන්දියන් සාගරය මධ්‍යයේ සුවිශේෂී ස්ථානයක පිහිටා ඇති බවට තොරතුරු ඉදිරිපත් කරයි.<br>• ඉන්දියන් සාගරය තුළ අනෙකුත් රටවලට සාපේක්ෂ ව ශ්‍රී ලංකාවේ පිහිටීම සිතියමක් ඇසුරින් විස්තර කරයි. | 10 |
| **භෞතික හා මානුෂ භූ දර්ශන තේරුම් ගැනීමට උපකාරී වන මූලික සංකල්ප සහ ක්‍රමවේද විමර්ශනය කරයි.** | 6.4.2 ශ්‍රී ලංකාවේ ආර්ථික වශයෙන් වැදගත් ස්ථාන කිහිපයක පිහිටීම සිතියමකින් හඳුනා ගනියි. | 6.4.2 ශ්‍රී ලංකාවේ ආර්ථික වශයෙන් වැදගත් ස්ථාන<br>• ප්‍රධාන වරායන්<br>• ප්‍රධාන ගුවන්තොටුපළ<br>• ප්‍රධාන නගර – පළාත් අගනගර<br>• අධිවේගී මාර්ගයේ ප්‍රධාන පිවිසුම් ස්ථාන<br><br>✶ ශ්‍රී ලංකා ආකෘති සිතියමක ඉහත දෑ ලකුණු කර නම් කිරීම | • ශ්‍රී ලංකාවේ ආර්ථික වශයෙන් වැදගත්වන ස්ථාන කිහිපයක් නම් කරයි.<br>• එම ස්ථාන සිතියමකින් හඳුනාගෙන පිහිටීම ශ්‍රී ලංකා ආකෘති සිතියමක ලකුණු කර නම් කරයි.<br><br>• දූපත්වල විශාලත්වය අනුව දූපත් වර්ග කරයි. | |

| නිපුණතාව | විෂය නිපුණතා හා නිපුණතා මට්ටම් | අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| | 6.4.3 ශ්‍රී ලංකාව ලෝකයේ වෙනත් දූපත්වල විශාලත්වය අනුව සසඳයි. | 6.4.3 ශ්‍රී ලංකාව හා ලෝකයේ වෙනත් දූපත්<br>• මැඩගස්කරය<br>• ග්‍රීන්ලන්තය<br>• කියුබාව<br>• තායිවානය<br>• සිසිලිය<br><br>(අ) ලෝක සිතියම<br>(ආ) ලෝක ගෝලය ඇසුරින් ශ්‍රී ලංකාවේ පිහිටීම හඳුනා ගැනීම හා ලෝක ආකෘති සිතියමක ලකුණු කර නම් කිරීම | • ශ්‍රී ලංකාව ඇතුළු දූපත් කිහිපයක් ලෝක ආකෘති සිතියමක ලකුණු කොට නම් කරයි.<br>• මෙම දූපත් ප්‍රමාණයෙන් කුඩා, මධ්‍යම හා විශාල ඒවා ලෙස ලෝකයේ විවිධ ප්‍රදේශවල පිහිටා ඇති බව සිතියමක් ඇසුරින් විස්තර කිරීම.<br><br>✶ ලෝක ආකෘති සිතියමක ලකුණුකර නම් කිරීම. | |

# ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

# ඒකකය 6.1 : පාසල අවට වටපිටාවේ අන්තර් සම්බන්ධතාව

1. **නිපුණතාව** : තමා ජීවත්වන පරිසරයේ ස්වභාවය හා ක්‍රියාවලි පිළිබඳ අවබෝධයෙන් ජීවත් වෙයි.

2. **නිපුණතා මට්ටම** : **6.1.1 තම පාසල හා අවට වටපිටාව පිළිබඳ තොරතුරු රැස්කර ඉදිරිපත් කරයි.**

3. **කාලච්ඡේද** : 06

4. **ඉගෙනුම් පල** :
   - පාසල පිහිටි පරිපාලන කොට්ඨාස ධූරාවලි නම් කරයි.
   - ශ්‍රී ලංකා ආකෘති සිතියමක පාසලේ පිහිටීම ලකුණු කරයි.
   - පාසල පිහිටීම දක්වන පරිපාලන ධූරාවලියේ අන්තර් සම්බන්ධතාව පැහැදිලි කරයි.
   - පාසල පිහිටි භූමියේ සැලැස්ම ඇඳ ඉඩමේ හැඩය ඉදිරිපත් කරයි.
   - තෝරාගත් වැදගත් ස්ථාන කිහිපයකට පාසලේ සිට ඇති දිශාව හා දුර දක්වන වගුවක් සකස් කරයි.

5. **පාඩම සැලසුම සඳහා උපදෙස්**

6.1.1 නිපුණතා මට්ටම 6.1.1, 6.1.2 හා 6.1.3 වශයෙන් කොටස් තුනක් යටතේ විස්තර වේ. ඔබ පාසල පිහිටා ඇත්තේ ග්‍රාමීය පරිසරයක, වතු පරිසරයක හෝ නාගරික පරිසරයක විය හැකි ය. එහි පිහිටීම දැක්විය හැකි විවිධ ක්‍රම තිබේ. ශ්‍රී ලංකාවේ පරිපාලන ධූරාවලියට අනුව පාසලේ පිහිටීම දැක්වීම ඉන් එක් ක්‍රමයකි. එමගින් ග්‍රාම නිලධාරී කොට්ඨාසය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, දිස්ත්‍රික්කය, පළාත හා රටතුළ පාසලේ පිහිටීම හඳුනා ගැනීමට පුළුවන. මෙවැනි ධූරාවලියක දක්නට ඇති විවිධ ස්වරූප අතර අන්තර්සම්බන්ධතාවක් දක්නට ලැබේ. එමෙන් ම ශ්‍රී ලංකා සිතියමක් තුළ ඉහත ධූරාවලියට අනුව පාසලේ පිහිටීම පිළිබඳ ව සිසුන්ට අවබෝධයක් ලබා දීමට ද පුළුවන. පාසලේ පිහිටීම සිතියම් ගත කිරීම තුළින් සිතියම් විද්‍යාත්මක මූලධර්ම පිළිබඳ ව මූලික අවබෝධයක් ලබා දීමත් මෙම ඒකකය ඉගැන්වීමෙන් අපේක්ෂා කෙරේ. එමෙන් ම ඔබ පාසලේ පරිගණක සහ අන්තර්ජාල පහසුකම් තිබේ නම් ඒ මගින් පාසලේ පිහිටීම පිළිබඳ ව හඳුනා ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දීම ද වැදගත් වෙයි.

විෂය නිර්දේශයේ 6.1.1 කොටස සඳහා කාලච්ඡේද හයක කාලයක් යොදා ගැනීම සුදුසු ය. මේ සඳහා විවිධ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේද ඔබට භාවිත කළ හැකිය. එවැනි ක්‍රමවේද අතරින් කිහිපයක් පහත දැක්වේ.

- ප්‍රශ්නාවලියක් භාවිත කිරීම
- සිතියම් ලකුණු කිරීම
- තොරතුරු රැස්කිරීම
- පරිගණක හා අන්තර්ජාලය භාවිතයෙන් පාසලේ පිහිටීම හඳුනා ගැනීම

ඉහත ඉගැන්වීමේ ක්‍රමවේද එලෙසින් ම භාවිත කිරීම ඔබෙන් අපේක්ෂා නො කෙරේ. අපේක්ෂිත ඉගෙනුම් පල ළඟා කර ගැනීම සඳහා සුදුසු ඉගැන්වීමේ ක්‍රමවේද භාවිත කිරීමේ නිදහස ඔබට ඇත.

**"සිතියමකින් දැක්වෙන තොරතුරු හඳුනා ගැනීම සඳහා අවශ්‍ය වන දිශාව, දුර පිළිබඳ අදහස සිසු නිර්මාණ තුළ කිසියම් ලෙසකින් ඇතුළත් ව තිබේ දැයි පරීක්ෂා කර බලන්න. සිතියම කියවීම සඳහා ඒවා වැදගත්වන ආකාරය සිසුන්ට පෙන්වා දෙන්න. එහෙත් පාරිභාෂික වචන භාවිත කිරීම අවශ්‍ය නොවේ."**

මෙම ක්‍රියාකාරකම සඳහා සුදුසු ඇගයීම් නිර්ණායක යොදා ගන්න.

**පරිගණකය හා අන්තර්ජාලය භාවිතයෙන් පාසලේ පිහිටීම හඳුනා ගැනීම**

පාසලේ පිහිටීම පිළිබඳ නිවැරදි අදහසක් ගොඩනැගීම සඳහා අන්තර්ජාල සිතියම් ද උපයෝගි කරගත හැකි ය. ඔබේ පාසලේ එවැනි පහසුකම් තිබේ නම් ඒවායින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කරන්න. එය සිසුන්ගේ දැනුම දියුණු කරන ඔවුන්ගේ උනන්දුව වැඩිකරන ක්‍රියාමාර්ගයක් වනු ඇත. මේ සඳහා අන්තර්ජාලය ඔස්සේ සපයා ගන්නා ලද (google earth) සිතියම් කොටස් ලබාගෙන පාසලේ පිහිටීම හඳුනා ගැනීමට ක්‍රියාකාරී ක්‍රමවේදයක් ගොඩනගා ගන්න.

**6. ගුණාත්මක යෙදවුම් :**

- පළාත් හා දිස්ත්‍රික් මායිම සහිත ලංකා සිතියම
- අදාළ ග්‍රාම නිලධාරී වසමේ සිතියම
- අන්තර්ජාලය (Google Earth)
- පෙළ පොත

**7. තක්සේරුව හා ඇගයීම**

ඔබ සැලසුම් කරන ලද පාඩමට අදාළ ව පහත සඳහන් නිර්ණායක අතුරින් පහක් තෝරාගෙන ලකුණු පවරන්න.

- ප්‍රශ්නාවලිය භාවිත කර තොරතුරු රැස් කරයි.
- රැස්කරගත් තොරතුරු නිවැරදි ව වර්ග කරයි.
- රැස්කරගත් තොරතුරු ක්‍රමානුකූල ව ඉදිරිපත් කරයි.
- පාසලේ පිහිටීම නිවැරදි ව සිතියමක ලකුණු කරයි.
- අන්තර්ජාලය භාවිතයෙන් පාසලේ පිහිටීම සොයා බලයි.
- ලකුණු කරන ලද සිතියමේ තොරතුරු නිවැරදි ව ඉදිරිපත් කරයි.
- පාසල් භූමියේ හැඩය නිවැරදි ව ඇඳ දක්වයි.
- පාසලේ සිට තෝරාගත් ස්ථාන කිහිපයක දිශාව හා දුර නිවැරදි ව ඉදිරිපත් කරයි.
- කණ්ඩායම තුළ සාමූහික ව කටයුතු කරයි.
- පිරිසිදු ව හා ක්‍රමානුකූල ව ඉදිරිපත් කරයි.

1. **නිපුණතාව** : භෞතික හා මානව භූ දර්ශකයේ සංරචක ගති ලක්ෂණ හා ක්‍රියාවලි පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

2. **නිපුණතා මට්ටම** : පාසල අවට වටපිටාවේ කාලගුණික ස්වභාවය පැහැදිළි කරයි.

3. **කාලච්ඡේද** : 06

4. **ඉගෙනුම් පල** :
   - කාලගුණය යන්න අර්ථ දක්වයි.
   - කාලගුණික අංග නම් කරයි.
   - වර්ෂාපතනය මැනීම සඳහාත්, සුළගේ දිශාව හඳුනා ගැනීම සඳහාත් සුදුසු සරල උපකරණ නිර්මාණය කරයි.
   - උෂ්ණත්වමානයක් භාවිත කර උෂ්ණත්වය සටහන් කරයි.
   - වර්ෂාමානයක් භාවිත කර වර්ෂාපතනය මැන සටහන් කරයි.
   - සුළං දිශා දර්ශකයක් භාවිතයෙන් සුළං හමන දිශාව ප්‍රකාශ කරයි.
   - අහස නිරීක්ෂණය කර වලා වැස්ම පිළිබඳ සටහන් තබා ගනියි.
   - සුවිශේෂ කාලගුණික සංසිද්ධීන් පිළිබඳ තොරතුරු ප්‍රකාශ කරයි.
   - පාසල අවට වටපිටාවේ දෛනික කාලගුණය පිළිබඳ ප්‍රකාශ ඉදිරිපත් කරයි.

5. **පාඩම සැලසුම සඳහා උපදෙස්**

පාසල අවට ප්‍රදේශයේ කාලගුණික තත්ත්වය සරල ව එහෙත් විද්‍යානුකූල ව තේරුම් ගැනීමට අවස්ථාව සැලසීම 6.1.2 කොටස ඉගැන්වීමේ මූලික අරමුණ යි. උෂ්ණත්වය, වර්ෂාපතනය, සුළං හමන දිශාව, වලා වැස්ම වැනි ප්‍රධාන කාලගුණික අංග තේරුම් ගැනීමට අවශ්‍ය පසුබිම ගොඩනැගීම මෙයින් බලාපොරොත්තු වේ. එමෙන් ම කාලගුණික තොරතුරු එක්රැස් කිරීම සඳහා සරල උපකරණ නිර්මාණය හා ඒවා භාවිතය පිළිබඳ කුසලතා ලබා දීමත්, කාලගුණික දත්ත රැස්කිරීම, දත්ත සටහන් කිරීම හා දත්ත මගින් සරල නිගමනවලට එළඹීම වැනි හැකියා වර්ධනය කිරීමත් මෙම කොටස ඉගැන්වීමේ අපේක්ෂාවයි. සිසුන් තුළ කාලගුණය පිළිබඳ සරල අදහසක් ගොඩනැගෙන පරිදි දක්වා ඇති ක්‍රියාකාරකම් සංවිධානය කර ගැනීම මෙමගින් අපේක්ෂා කෙරේ.

මෙම කොටස සඳහා කාලඡේද හයක පමණ කාලයක් යොදා ගැනීම සුදුසු ය. මේ සඳහා විවිධ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේද භාවිත කළ හැකි ය. එවැනි ක්‍රමවේද අතරින් දෙකක් පහත ඉදිරිපත් කොට ඇත.

1. නිරීක්ෂණ මගින් වෙනස් වන කාලගුණ තත්ත්වයක් හඳුනා ගැනීම
2. ප්‍රදේශයේ කාලගුණික තොරතුරු එක්රැස් කිරීම

මෙම පාඩම් ක්‍රියාකාරී හා උපරිම සිසු සහභාගිත්වය මෙන් ම ශිෂ්‍යයා උනන්දුවෙන් සහභාගි කරවන පාඩම් ලෙස සැලසුම් කර අධ්‍යයන වාරයක් පුරා ම වුව ද ක්‍රියාත්මක කළ හැකි ය.

**ප්‍රදේශයේ කාලගුණය පිළිබඳ සරල නිගමනයන්ට පැමිණීම සඳහා දීර්ඝ කාලයක් තිස්සේ තොරතුරු සටහන් කර ගැනීම අවශ්‍ය වෙයි. එබැවින් මෙම ඒකකය ඉගැන්වීමේ දී ආරම්භ කරනු ලබන කාලගුණ තොරතුරු රැස්කිරීමේ ක්‍රියාවලිය දෛනික ව දිගු කාලයක් තිස්සේ පවත්වාගෙන යාම අවශ්‍ය වන හෙයින් ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් සැලසුම් කොට ක්‍රියාත්මක කිරීම ඔබ සතු වගකීමකි.**

**6. ගුණාත්මක යෙදවුම් :**

වර්ෂාමානය, උෂ්ණත්වමානය, සුළං දිශා දර්ශකය, පෙළ පොත

**7. තක්සේරුව හා ඇගයීම :**

පහත සඳහන් නිර්ණායකවලින් පහක් තෝරාගෙන ලකුණු පවරන්න.

- කාලගුණය යනු කුමක් දැ යි නිවැරදි ව පැහැදිලි කරයි.
- කාලගුණික අංග නම් කරයි.
- වර්ෂාමානයක් නිවැරදි ව නිර්මාණය කරයි.
- වර්ෂාමානය භාවිතයෙන් වර්ෂාපතනය මැන සටහන් තබා ගනියි.
- සුළං දිශා දර්ශකයක් නිර්මාණය කරයි.
- සුළං දිශා දර්ශකය ඇසුරින් සුළඟේ දිශාව වෙනස්වන බව කියයි.
- අහස නිරීක්ෂණය කර වලාකුළු පිළිබඳ විස්තර කරයි.
- කාළගුණික සංසිද්ධි පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.

1. **නිපුණතාව** : දත්ත හා තොරතුරු රැස්කිරීම, විශ්ලේෂණය කිරීම, අර්ථ නිරූපණය හා ඉදිරිපත් කිරීම සඳහා භූගෝල විද්‍යාවේ ක්‍රම ශිල්ප භාවිත කරයි.

2. **නිපුණතා මට්ටම** : **6.1.3 පාසල අවට වටපිටාවේ භූ දර්ශනයෙහි සැලැස්මක් නිර්මාණය කරයි.**

3. **කාලච්ඡේද** : 06

4. **ඉගෙනුම් පල** :
   - පාසල අවට භූ දර්ශනය චිත්‍රයට නඟයි.
   - පාසල අවට ප්‍රජාව භූ දර්ශනයේ සම්බන්ධතාව දළ සැලැස්මකින් පෙන්වයි.
   - පාසල අවට වටපිටාවේ භූ දර්ශනය විස්තර කරයි.
   - පාසල අවට භූ දර්ශනය හඳුනාගෙන එහි ඇති සරල හෝ සංකීර්ණ බව පැහැදිලි කරයි.

5. **පාඩම සැලසුම සඳහා උපදෙස්**

පාසල අවට වටපිටාවේ භූ දර්ශනයේ විශේෂිත ලක්ෂණ එකිනෙක හඳුනාගෙන ඒ මගින් සමස්ත භූ දර්ශනය තේරුම් ගැනීමට අවස්ථාව සලසා දීම මෙම ඒකකයේ ප්‍රධාන අරමුණ වේ.

- පාසල අවට භූමියේ උස් පහත් බව
- ගංගා හා ඇළ දොළ ගලා බස්නා රටාව
- විවිධ බෝග වර්ග ව්‍යාප්ත වී ඇති ආකාරය
- වනාන්තර ප්‍රදේශ ව්‍යාප්තිය
- මාර්ග, මංසන්ධි, සන්නිවේදන කුලුනු ආදියේ පිහිටීම
- ජනාවාස පිහිටා ඇති ආකාරය

ඉහත දක්වා ඇති තොරතුරු සියල්ලේ අන්තර්සම්බන්ධතාව මගින් ගොඩනැගී ඇත්තේ ප්‍රදේශයේ භූ දර්ශනය යි. සමස්තයක් ලෙස මෙම අදහස සිසුන් තුළ ඇතිකිරීමට පාඩම සංවිධානය කර ගැනීම මෙ මඟින් බලාපොරොත්තු වේ.

*උදා :*
- පාසල අවට වටපිටාවේ භූ දර්ශනයේ චිත්‍රයක් ඇඳීම
- පාසල අවට භූ දර්ශනයේ දළ සැලැස්මක් ඇඳීම
- අන්තර්ජාල සිතියම් භාවිතය (Google earth)

**පාඩම් සමාලෝචනයේ දී භෞතික භූ දර්ශනය හා මානුෂ භූ දර්ශනය අතර ඇති සම්බන්ධතාව පැහැදිලි වන සේ සාකච්ඡාව මෙහෙයවීමට කටයුතු කරන්න.**

**එක් එක් කණ්ඩායම්වලට ගොස් සිසුන් සමඟ අදහස් හුවමාරු කරමින් පාසල අවට ප්‍රදේශයේ ඇති භූ දර්ශනයේ සමස්ත බව සිසුන්ට අවබෝධ කර ගැනීමට අවශ්‍ය උදව් ලබා දෙන්න. සිතියම් සැසඳීමෙන් ඒවායේ ඇති ස්ථාන හා අසමාන ලක්ෂණ ඉස්මතු කිරීමෙන්**

**මෙම කාර්යය පහසුවෙන් කළ හැකි වනු ඇත.**

6. **ගුණාත්මක යෙදවුම් :**

- අන්තර්ජාලය (Google Earth)
- පෙළ පොත
- ස්වභාවික පරිසරය හා විවිධ භූ දර්ශනවල පින්තූර

7. **තක්සේරුව හා ඇගයීම :**

පාඩමට අදාළ ව පහත සඳහන් නිර්ණායක අතුරින්පහක් තෝරාගෙන ලකුණු පවරන්න.

- පාසල හා අවට භූදර්ශනය නිරීක්ෂණය කරයි.
- නිරීක්ෂණයෙන් ලබාගත් තොරතුරු නිවැරදි ව ඉදිරිපත් කරයි
- පාසල අවට භූ දර්ශනයේ චිත්‍රයක් අඳියි.
- පාසල අවට භූ දර්ශනයේ දළ සිතියමක් අඳියි.
- පාසල අවට භූ දර්ශනයේ දළ සිතියම පැහැදිලි කරයි.
- අන්තර්ජාලය භාවිතයෙන් පාසල අවට භූමියේ තොරතුරු රැස්කරයි.

# ඒකකය 6.2 : නිවස අවට වටපිටාවේ ස්වභාවය හා විවිධත්වය

1. **නිපුණතාව** : තමා ජීවත්වන පරිසරයේ ස්වභාවය හා ක්‍රියාවලි පිළිබඳ අවබෝධයෙන් ජීවත් වෙයි.

2. **නිපුණතා මට්ටම** : 6.2.1 **නිවස අවට වටපිටාවේ ස්වභාවය හා විවිධත්වය පැහැදලි කරයි.**

3. **කාලච්ඡේද** : 06

4. **ඉගෙනුම් පල** :
   - තම නිවෙස් අවට වටපිටාවේ භූ ලක්ෂණ හඳුනා ගනියි.
   - තම නිවෙස් අවට වටපිටාවේ භූමියේ විවිධත්වය පැහැදිලි කරයි.
   - නිවෙස් අවට වටපිටාවේ මතුපිට ස්වරූපය ආකෘති මගින් ඉදිරිපත් කරයි.
   - සිසුන් තම නිවෙස් පිහිටි වටපිටාව එකිනෙකාගෙන් වෙනස් බව අවබෝධයෙන් විස්තර කරයි.

5. **පාඩම සැලසුම සඳහා උපදෙස්**

තම පාසල අවට වටපිටාවේ කාලගුණ තත්ත්වය, එහි භූ දර්ශනය හඳුනාගත් සිසුනට තමා ජීවත් වන වටපිටාවේ භූමියේ ස්වරූපයත්, එම ස්වරූපය අනුව දැකිය හැකි විවිධත්වය පිළිබඳවත් අවබෝධයක් ලබා ගැනීම වැදගත් ය. ඒ භූගෝල විද්‍යාව විෂයය හදාරනු ලබන සිසුන් වශයෙන් තමා ජීවත් වන පරිසරයේ ස්වභාවය හා ක්‍රියාවලි පිළිබඳ මූලික අවබෝධයක් ලබා ගැනීම භූගෝල විද්‍යා විෂයයේ ප්‍රධාන අරමුණක් වන බැවිනි. පාසලට පැමිණෙන සිසුන් විවිධ පරිසර තත්ත්වවල සිට පැමිණිය හැකි ය. ග්‍රාමීය හෝ නාගරික වේවා මතුපිට දැකිය හැකි වෙනස්කම් අනුව එය උස් බිමක, තැනිතලාවක, කඳුවැටි ආශ්‍රිත ව, බෑවුමක, ගංගා, ජලාශ, වැව් ආශ්‍රිත ව, වෙරළ තීරයක ආදි වශයෙන් විවිධ විය හැකි ය. පිහිටා ඇති ප්‍රදේශය අනුව සුවිශේෂී ලක්ෂණ හඳුනාගත හැකි වනු ඇත. එසේ ම නිවස අවට වටපිටාවේ භූ දර්ශනය මත මානව ක්‍රියාකාරකම් එකිනෙකට වෙනස් විය හැකි බැවින් අවට වටපිටාවේ ස්වභාවය අනුව විවිධත්වයක් හඳුනාගත හැකි ය. ඒ අනුව මෙම නිපුණතා මට්ටමට අදාළ විෂය සන්ධාරය ඉගැන්වීම තුළින් බලාපොරොත්තු වන්නේ සිසුන්ට තම නිවස අවට වටපිටාවේ භූමියේ මතුපිට ස්වරූපයත්, ඒ තුළින් ගොඩනැගී ඇති විවිධත්වය පිළිබඳවත් අවබෝධයක් ලබා දීම යි. එමෙන් ම මේ තුළින් සමස්ත අන්තර්ගතය ඉගැන්වීමක් බලාපොරොත්තු නොවන අතර, තම ප්‍රදේශයේ භූමියේ ස්වභාවයට පමණක් සුවිශේෂී අවධානය යොමු කිරීම වැදගත් ය.

- භූමියේ මතුපිට දක්නට ලැබෙන (භෞතික හා මානුෂ) දර්ශනය සරලව භූ දර්ශනය ලෙස හඳුනා ගත හැකි ය.
- භෞතික පරිසරයේ තැනින් තැනට වෙනස්වන සුළු බව හා භූමියේ මතුපිට පවතින මෙම වෙනස්කම් භූ විෂමතාව ලෙස සරල ව හඳුනා ගත හැකි ය.
- උස්බිමක් යනු යම් බිමකට සාපේක්ෂ ව උසින් පිහිටි බිමකි.

- උස් බිම් කඳුකර ප්‍රදේශවල මෙන් ම පහත් බිම් ආශ්‍රයෙන් ද දක්නට ලැබේ.
- කන්දක් යනු උස් බිමකට සාපේක්ෂ ව උසින් පිහිටි මුදුනකි.
- තැනිතලා ප්‍රදේශ යනුවෙන් හඳුන්වනු ලබන්නේ උස් බිම්වලට සාපේක්ෂ ව පහත් ප්‍රදේශයකි. නැතහොත් බෑවුම ඉතා අඩු ප්‍රදේශයකි.
- බෑවුම් ප්‍රදේශයක් ප්‍රදේශයේ ජලය ගලා බසින දිශාව අනුව තීරණය කළ හැකි ය.
- කඳුකර ප්‍රදේශ ආශ්‍රයෙන් ගලා බසින කුඩා දියපහරවල් තුළින් දියඇළි, ඇළ, දොළ, ගංගා නිර්මාණය වේ.
- තම නිවෙස් ආශ්‍රිත වටපිටාව තුළ ස්වාභාවික නිර්මාණවලට අමතර ව මිනිසා විසින් ගොඩනැගූ වැව්/ජලාශ ද දක්නට ලැබේ.
- වැව්/ජලාශ ආදිය නිර්මාණය කොට ඇත්තේ ප්‍රදේශයේ ඇති භූමියේ ස්වභාවය, දේශගුණ තත්ත්වය, කෘෂිකාර්මික ආදි ආර්ථික කටයුතු සැලකිල්ලට ගනිමිනි.
- අප අවට පරිසරයේ භූමිය මතුපිට පවතින මෙවැනි ලක්ෂණ අනුව ප්‍රදේශයකින් තවත් ප්‍රදේශයක් වෙනස් වේ.
- ආසන්න වටපිටාවේ පවතින විවිධත්වය හේතු කොට ගෙන සමාජ, ආර්ථික වටපිටාවේ මානුෂ ක්‍රියාකාරකම්වල වෙනස්කම් පවතී.
- තමා ජීවත්වන වටපිටාව අනුව විටක මානුෂ ක්‍රියාකාරකම්වලට බලපෑම් ද එල්ල විය හැකි ය. *උදා :* ස්වාභාවික උපද්‍රව, ගංවතුර, නායයෑම්, සුනාමි, සුළි සුළං ආදිය

පහත සඳහන් ක්‍රමවේද ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා යොදාගත හැකි ය.

- නිවස අවට වටපිටාවේ චිත්‍රයක්/දළ සටහනක් ඇඳීම
- නිවස අවට වටපිටාවේ ත්‍රිමාණ ආකෘතියක් ගොඩනැගීම

6. **ගුණාත්මක යෙදවුම්** :

සැලසුම් කරන ලද පාඩමට අදාළ ව සිතියම්, රූපසටහන්, ආකෘති සැකසීමට අවශ්‍ය ද්‍රව්‍ය හා පෙළ පොත, මැටි, ක්ලේ හෝ පල්ප්, දිය සායම්

7. **තක්සේරුව හා ඇගයීම** :

පාඩමට අදාළ ව පහත සඳහන් නිර්ණායක අතුරින් පහක් තෝරා ලකුණු පවරන්න.

- තම නිවෙස අවට පරිසරය නිරීක්ෂණය කර තොරතුරු රැස් කරයි.
- රැස් කරගත් තොරතුරු ඉදිරිපත් කරයි.
- නිවස අවට වටාපිටාවේ චිත්‍රයක් නිර්මාණය කරයි.
- නිවස අවට වටපිටාවේ දළ සටහනක් අඳියි.
- නිවස අවට වටපිටාවේ ත්‍රිමාණ ආකෘතියක් ගොඩ නගයි.
- නිර්මාණශීලී ව නිවැරදි තොරතුරු ඉදිරිපත් කරයි.
- නිවස අවට වටපිටාවේ සුන්දරත්වය අගය කරයි.

1. **නිපුණතාව** : භෞතික හා මානුෂ ක්‍රියාවලියේ අන්තර් ක්‍රියා භූගෝලීය පරිසරය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

2. **නිපුණතා මට්ටම** : **6.2.2 නිවස අවට වටපිටාවේ ශාක හා සත්ත්වයින් නිරීක්ෂණය කර විවිධත්වය පැහැදිලි කරයි.**

3. **කාලච්ඡේද** : 04

4. **ඉගෙනුම් ඵල** :
   - තම නිවස අවට වටපිටාවේ දක්නට ලැබෙන ශාක හා සත්ව වර්ග හඳුනා ගනියි.
   - නිවස අවට වටපිටාවේ ශාක හා සත්ව වර්ගවල ප්‍රයෝජන ඇතුළත් වගුවක් සකස් කරයි.
   - ශාක හා සත්ත්ව විවිධත්වය රැක ගැනීමේ වැදගත්කම විස්තර කරයි.

5. **පාඩම් සැලසුම සඳහා උපදෙස්**

නිවස අවට වටපිටාව තුළ ශාක හා සතුන් දක්නට ලැබේ. ග්‍රාමීය පරිසරය තුළ විවිධ ශාක හා සත්ත්ව වර්ග දැක ගත හැකි වුවත්, නාගරික පරිසරය තුළ ශාක හා සත්ත්ව වර්ග දැකීම ඉතා සීමිත ය. ඔබ ජීවත් වන පරිසරය සුන්දර එකක් වන්නේ මේ ශාක හා සත්ත්ව ප්‍රජාව නිසා ම ය.

පරිසරයේ ඇති ශාක හා සතුන් අතර දැඩි සම්බන්ධතාවක් පවතී. සතුන්ට අවශ්‍ය ආහාර, සෙවණ ලබා ගැනීමට හා කූඩු තනා ගැනීමට ශාක උපකාරී වේ. කොට්ටම්බා, අඹ, කජු වැනි ශාක සතුන් මගින් විවිධ ප්‍රදේශවල ව්‍යාප්ත වනවා පමණක් නොව සතුන්ගේ ඇඟේ ඇලෙන ඇපල, තුත්තිරි වැනි බීජ බොහෝ ප්‍රදේශවලට ව්‍යාප්ත වේ. එපමණක් ද නොව ශාකවල ඵල හට ගැනීමට අවශ්‍ය පරාගනය සිදු කරනුයේ මලින් මලට පියඹා යන සමනළ, මී මැසි හා කෘමීහු ය. මෙයින් පැහැදිලි වන්නේ පරිසරයේ ඇති ශාක හා සතුන් අතර දැඩි සම්බන්ධතාවක් පවතින බවයි.

පහත සඳහන් ක්‍රියාකාරකම් මෙම ඒකකය සඳහා සකස්කර ගත හැකි ය.

- නිවස අවට වටපිටාව නිරීක්ෂණය කර සතුන් ඇතුළත් වර්ගීකරණ ලේඛනයක් සැකසීම
- පාසල් භූමියේ ශාක නිරීක්ෂණයට යොමුකර විවිධ අවශ්‍යතා හා ප්‍රයෝජන ඇතුළත් වගුවක් සැකසීම
- සත්ත්ව ප්‍රජාව හා ශාක පරිසරයේ ම කොඩසකි. යටතේ කණ්ඩායම් ක්‍රියාකාරකමක් සැකසීම

6. **ගුණාත්මක යෙදවුම්** :

පෙළ පොත, සැලසුම් කරන ලද පාඩමට අදාළ ව රූපසටහන්, ස්වාභාවික ද්‍රව්‍ය, ආකෘති ආදිය යොදා ගන්න.

7. **තක්සේරුව හා ඇගයීම :**

පාඩමට අදාළව පහත සඳහන් නිර්ණායක අතුරින් පහක් තෝරාගෙන ලකුණු පවරන්න.

- නිවස අවට වටපිටාව නිරීක්ෂණය කර ශාක හා සත්ත්ව තොරතුරු රැස් කරයි.
- රැස්කරගත් තොරතුරු වර්ගකර වගුගත කරයි.
- ශාක හා සත්ත්ව වර්ගවල ප්‍රයෝජන ඉදිරිපත් කරයි.
- ශාක හා සත්ත්ව විවිධත්වය රැක ගතයුතු බව ප්‍රකාශ කරයි.
- ශාක හා සත්ත්ව ප්‍රජාව පරිසරයේ ම කොටසක් බවට තොරතුරු ඉදිරිපත් කරයි.
- නිර්මාණශීලී ව තොරතුරු ඉදිරිපත් කරයි.
- දෙන ලද උපදෙස් අනුව ක්‍රියාත්මක වේ.

1. **නිපුණතාව** : භෞතික හා මානුෂ භූ දර්ශනයේ සංරචක, ගතිලක්ෂණ හා ක්‍රියාවලි පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

2. **නිපුණතා මට්ටම** : 6.2.3 **පාසල/නිවස අවට වටපිටාවේ මානව ප්‍රජාවගේ මානුෂ ක්‍රියාකාරකම්වල ස්වභාවය පැහැදිලි කරයි.**

3. **කාලච්ඡේද** : 08

4. **ඉගෙනුම් පල** :
   - පාසල අවට ප්‍රජාව පිළිබඳ ව තොරතුරු රැස්කරයි.
   - නිවස අවට ප්‍රජාව සාමූහික ව කටයුතු කිරීමේ වැදගත්කම නිදසුන් ඇසුරින් පැහැදිළි කරයි.
   - තම නිවස අවට වටපිටාවේ මිනිසුන්ගේ කෘෂිකාර්මික, ආර්ථික කටයුතුවල විවිධත්වය පැහැදිලි කරයි.
   - තම පාසල අවට ප්‍රදේශයේ ඇති කර්මාන්ත වර්ග හඳුනාගෙන එහි ස්වභාවය විස්තර කරයි.
   - තම නිවස අවට වටපිටාවේ දක්නට ලැබෙන සේවා සපයන ආයතන හා පුද්ගලයින් සටහන් ඇසුරින් පෙන්වා දෙයි.

5. **පාඩම් සැලසුම සඳහා උපදෙස්**

නිවස හා පාසල අවට වටපිටාව හඳුනා ගැනීමේ දී එහි වෙසෙන ප්‍රජාව පිළිබඳ ව නිවැරදි අවබෝධයක් ලබාගැනීම වැදගත් වේ. ශ්‍රී ලංකාව තුළ සිංහල, දමිල, මුස්ලිම් (යෝනක, මැලේ), බර්ගර් යන ජන වර්ග වාසය කරන බැවින් පාසල අවට ප්‍රදේශය ද එකී විවිධත්වයකින් යුක්ත විය හැකි ය. ඇතැම් ප්‍රදේශවල සුලබව දක්නට නොලැබෙන අතර ඒකීය ජනවර්ගයක් ව්‍යාප්ත වීම දක්නට ලැබේ.

පාසල අවට ප්‍රදේශය ද ඉහත ආකාරයට ඒකීය ජන වර්ගයක් හෝ ජන වර්ග කිහිපයකින් සමන්විත විය හැකි ය. ජන විවිධත්වයක් පවතින විට නිරතුරු ව ආකල්ප, විශ්වාස, සිතුම් පැතුම් පිළිබඳ ව ගැටුම් ඇති විය හැකි බැවින් පාසල අවට ප්‍රජාව සමග සහජීවනයෙන් කටයුතු කිරීම වැදගත් වේ.

පාසල අවට ප්‍රදේශ හඳුනා ගැනීමේ දී මිනිසා මැදිහත් වීමෙන් සිදු කරනු ලබන ආර්ථික කටයුතුවල ස්වභාවය හඳුනා ගැනීම වැදගත් වේ. ඒ අනුව කෘෂිකාර්මික, කාර්මික හා සේවා පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම ප්‍රයෝජනවත් වේ. එ මගින් ගමේ හා පාසලේ සංවර්ධනයට ප්‍රජාව හා ප්‍රජාවගේ ආර්ථික කටයුතු දායක වී ඇති ආකාරය මෙම පාඩමින් අවබෝධ කරගත හැකි ය.

තම නිවස හා පාසල අවට වටපිටාවේ විවිධත්වයකින් යුක්ත ප්‍රජාවක් සිටින අතර ඔවුන්ගේ සහයෝගයෙන් ජීවත් වෙමින් ප්‍රදේශයේ හා රටේ සංවර්ධනයට දායකත්වයක් ලබා දෙමින් ජීවත් වන ආකාරය පිළිබඳ අවබෝධයක් ලබා දීම මෙම ඒකකයෙන් අපේක්ෂා කෙරේ.

පහත අදහස් පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කරගන්න.

- පාසල අයත් ප්‍රදේශය ඒකීය හෝ බහුවාර්ගික ජන වර්ගයක් වෙසෙන ප්‍රදේශ විය හැකි

බැවින් ශ්‍රී ලංකාවේ වාසය කරන අනිකුත් ජනවර්ග, ආගමික ආයතන පිළිබඳ ව ද අවබෝධයක් ලබා දිය හැකි පරිදි සැලසුම් කර ගන්න.

- පාසල අවට ප්‍රදේශය පිළිබඳ ග්‍රාම නිලධාරීතුමාගෙන් තොරතුරු රැස්කර ඉදිරිපත් කරවන්න.
- නිවස අවට වටපිටාවේ ආර්ථික ක්‍රියාවලි පිළිබඳ තොරතුරු රැස්කර වර්ගීකරණයකට යොමු කරන්න.
- සේවාවල වැදගත්කම හා අවශ්‍යතාව සමාන බව අගය කිරීම වැදගත් ය.
- විවිධ ජාතීන් සාමූහික ව කටයුතු කරන ආකාරය පහත සඳහන් අවස්ථා ඇසුරු කර ගනිමින් භූමිකා රංගනයෙහි යෙදීමට අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම් ලබා දෙන්න.
- ජාති, ආගම් නියෝජනය වන පරිදි චරිත ඒ ඒ අවස්ථාවලට උචිත වන අයුරින් නිරූපණය සඳහා යොමු කරවන්න.
- පාසල/නිවස අවට වටපිටාවේ වගාකර ඇති බෝග වර්ග ඇසුරින් කාර්මික අමුද්‍රව්‍ය ලෙස ප්‍රයෝජනයට ගන්නා බෝග වර්ග වගුගත කරවන්න.
- පාසල අවට ප්‍රදේශයේ ඇති කර්මාන්ත හඳුනා ගැනීමට ක්ෂේත්‍ර චාරිකාවක්/පැවරුමක් සැලසුම් කරන්න.

**6. ගුණාත්මක යෙදවුම් :**

- ප්‍රශ්නාවලිය
- තොරතුරු රැස් කිරීමේ පත්‍රිකා
- පෙළ පොත
- චිත්‍ර හා රූප සටහන්

**7. තක්සේරුව හා ඇගයීම :**

සැලසුම් කරන ලද පාඩමට අදාළ ව පහත සඳහන් නිර්ණායක අතුරින් පහක් තෝරාගෙන ලකුණු පවරන්න.

- ප්‍රශ්නාවලියට/ තොරතුරු පත්‍රිකාවට අනුව තොරතුරු රැස් කරයි.
- පාසල/ නිවස අවට වටපිටාවේ ප්‍රජාව පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- පාසල/ නිවස අවට වටපිටාවේ ආර්ථික කටයුතු පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි, වර්ග කරයි.
- නිවස අවට ප්‍රජාව හඳුන්වා දීමට භූමිකා රංගනයක යෙදේ.
- ප්‍රජාව සමග සහයෝගයෙන් ජීවත් වීමේ වැදගත්කම ප්‍රකාශ කරයි.
- පාසල/ නිවස අවට වටපිටාවේ කෘෂි භෝග වර්ග කරයි / ප්‍රයෝජන ඉදිරිපත් කරයි.
- සේවා වර්ග කර සියලුම සේවාවල වැදගත්කම අගය කරයි.
- ක්ෂේත්‍ර චාරිකාවක් හෝ නිරීක්ෂණයක් මගින් අවට වටපිටාවේ කර්මාන්ත පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- කර්මාන්තවලින් ඇති ප්‍රයෝජන දක්වයි.

## ඒකකය 6.3 : තම නිවස අවට පරිසරය යහපත් ව පවත්වා ගැනීම

1. **නිපුණතාව** : භෞතික හා මානුෂ භූ දර්ශනය සංරක්ෂණය කිරීමට හා පවත්වා ගැනීමට උපකාරී වන ධනාත්මක ආකල්ප සහිත ව සංවේදී ව හැසිරෙයි.

2. **නිපුණතා මට්ටම** : 6.3.1 **තම නිවස හා අවට වටපිටාව යහපත් ව පවත්වා ගැනීමට කටයුතු කරයි.**

3. **කාලච්ඡේද** : 12

4. **ඉගෙනුම් පල** :
   - මිනිසා භූමිය ප්‍රයෝජනයට ගන්නා අවස්ථා විස්තර කරයි.
   - අවිධිමත් භූමි පරිහරණය ආශ්‍රිත ගැටලු ඉදිරිපත් කරයි.
   - භූමිය විධිමත් ව භාවිත කිරීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග විස්තර කරයි.
   - ජලයෙන් ලැබෙන ප්‍රයෝජන ලැයිස්තුගත කරයි
   - ජලය අරපිරිමැස්මෙන් භාවිත කිරීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග විස්තර කරයි.
   - ජලය සපයන මූලාශ්‍රයවල වැදගත්කම ප්‍රකාශ කරයි.
   - පානීය ජලය නිසි පරිදි ප්‍රයෝජනයට ගතයුතු බවට තොරතුරු ඉදිරිපත් කරයි.
   - වාතය දූෂණය වන ක්‍රම සඳහන් කරමින් ඒවා වළක්වා ගැනීමට ගත හැකි පියවර විස්තර කරයි.
   - බලශක්තිය සංරක්ෂණය සඳහා අනුගමනය කළ හැකි ක්‍රමෝපා විස්තර කරයි.

5. **පාඩම් සැලසුම සඳහා උපදෙස්**

මිනිසාට යහපත් දිවිපෙවෙතක් ගතකිරීම සඳහා තම නිවස සහ අවට පරිසරය යහපත් ව පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. භූමිය, ජලය සහ වාතය යනාදිය යහපත් ව පවත්වා ගත යුතු වන අතර ඒවා අප පරිසරයේ මූලික අංග වේ.

මානව කටයුතු පවත්වාගෙන යාම සඳහා බලශක්ති සම්පත් භාවිතයට ගැනීම ද අත්‍යවශ්‍ය සාධකයක් ව ඇත. බලශක්තිය නිපදවා ගන්නේ ද පරිසරයේ සම්පත් උපයෝගි කර ගනිමිනි. මිනිසාට සිය ජීවන කටයුතු පවත්වාගෙන යාමේ දී පරිසරයේ සම්පත් පරිහරණය කිරීමට සිදු වේ. එබැවින් පරිසරයේ සුරක්ෂිත බව රැකගනිමින් සම්පත් පරිහරණය කිරීමේ වැදගත්කම පිළිබඳ ආකල්ප සිසුන් තුළ වර්ධනය කිරීම මෙම ඒකකය ඉගැන්වීමේ මූලික අරමුණ වේ. ඉහතින් සඳහන් කළ පරිදි බලශක්තිය නිපදවා ගන්නේ පරිසරයේ සම්පත් උපයෝගි කර ගනිමින් වන බැවින් නිවසේ දී මෙන් ම පිටතදීත් බලශක්ති සංරක්ෂණයට යොමු වීම සම්පත් සංරක්ෂණයට දායක වීමකි.

භූමිය, ජලය සහ වාතය යන පරිසරයේ මූලික අංග යහපත් ව පවත්වා ගැනීමත් බලශක්ති සංරක්ෂණයට පෙලඹීමත් සිසුන් තුළ වර්ධනය විය යුතු යහපත් ගුණාංගයක් වේ.

එමෙන් ම ඉහත කී සම්පත් අනිසි ලෙස පරිහරණය කිරීමෙන් ඇති විය හැකි අහිතකර ප්‍රතිඵල අත්විඳීමට සිදුවනුයේ ද අපට ම ය. එබැවින් අප ජීවත්වන පරිසරය සුරැකෙන අයුරින් එදිනෙදා ජීවන කටයුතු පවත්වා ගැනීම අත්‍යවශ්‍ය සාධකයක් ව ඇත.

අනාගත පරපුර වන සිසු දරුවන් තුළ යහපත් පරිසරයක් පවත්වා ගැනීමේ ජීවන පුරුදු හා ආකල්ප ඇති කිරීම මෙ පාඩම් ඒකකය ඉගැන්වීමෙන් අපේක්ෂා කෙරේ.

- මෙම ඒකකය (6.3) 6.3.1 සහ 6.3.2 ලෙස නිපුණතා මට්ටම් 2කින් සමන්විත ය. මේ සඳහා කාලච්ඡේද 16 ක් වෙන්කොට ඇති අතර 6.3.1 නිපුණතා මට්ටම සාක්ෂාත් කර ගැනීම සඳහා කාලච්ඡේද 12 ක් යොදා ගැනීම සුදුසු ය.
- 6.3.1 ඒකකය විෂය අන්තර්ගතයේ,

  "භූමිය, ජලය, වාතය" සහ "බලශක්තිය" යන මූලික තේමා 4ක් අන්තර්ගත වේ. ඉන් භූමිය, ජලය, බලශක්තිය හා වාතය යන තේමා 4 සඳහා ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම් ඉගෙනුම් පල ළඟා කර ගත හැකි සේ සකස් කර ගන්න.
- "භූමිය අපට සම්පතකි", "භූමි සම්පත වැනසෙන ආකාරය", "අපේ භූමි සම්පත අප සුරකිමු" මාතෘකා යටතේ බිත්ති පුවත්පතක් සකස් කරන්න.
- "තම නිවස අවට වටපිටාව යහපත් ව පවත්වා ගැනීම" යටතේ ජල මූලාශ්‍රය/ජල මූලාශ්‍රයවල ප්‍රයෝජන, පරිහරණය පිළිබඳ ගැටලු, අරපිරිමැස්මෙන් භාවිතය, ජල මූලාශ්‍රය හා ජලය සංරක්ෂණය පිළිබඳ ක්‍රියාකාරකමක් සකසන්න.

- "වාතය දූෂණය වීමෙන් වළක්වා ගැනීම" ඉගැන්වීම සඳහා සුදුසු ක්‍රියාකාරකම් ප්‍රභේදයක් ඇසුරින් උචිත ක්‍රියාකාරකමක් සැලසුම් කරගන්න. එහි දී පහත විෂය කරුණු කෙරෙහි අවධානය යොමු කරන්න.

වාතය : ප්‍රයෝජන

* මිනිසා ඇතුළු ජීවීන්ගේ පැවැත්මට අවශ්‍ය වීම

* පරිසරයේ සමතුලිත පැවැත්මට අවශ්‍ය වීම

**වායු දූෂණය වන ක්‍රම :**

* කාර්මික කටයුතු

* කෘෂිකාර්මික කටයුතු

* ගෘහාශ්‍රිත අපද්‍රව්‍ය පිළිස්සීම

**වායු දූෂණය වැළැක්වීමට ගතහැකි ක්‍රියා මාර්ග :**

* වන විනාශය වැළැක්වීම

* වන වගාව

* නිවසේ ගස් සිටුවීම
* අපද්‍රව්‍ය නිවසේ පිළිස්සීමෙන් වැළකීම
* ප්‍රතිචක්‍රීකරණයට යොමු වීම

- මිනිස් කටයුතු සඳහා යොදාගනු ලබන විවිධ "බලශක්ති මූලාශ්‍රය" පිළිබඳ ව මූලික අවබෝධයක් සිසුන්ට ලබාදීමත්, නිවසේ එදිනෙදා කටයුතුවල දී බලශක්තිය අරපිරිමැස්මෙන් භාවිත කළ යුතු ආකාරය හා බලශක්තිය නාස්ති වීම වැළැක්වීමට ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ ව සිසුන් දැනුවත් කිරීම හා ඒ පිළිබඳ ආකල්ප වර්ධනයට ඉඩ සැලසීම සඳහා සුදුසු ක්‍රියාකාරකමක් සකස් කර ගන්න.

6. **ගුණාත්මක යෙදවුම්** :

    පෙළ පොත හා වෙනත් මූලාශ්‍ර

7. **තක්සේරුව හා ඇගයීම** :

    සැලසුම් කරන ලද ක්‍රියාකාරී පාඩමට අදාළ ව පහත සඳහන් නිර්ණායක අතුරින් පහක් තෝරාගෙන ලකුණු පවරන්න.

- නිවස අවට වටපිටාව පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- භූමිය ප්‍රයෝජනයට ගන්නා ආකාරය විස්තර කරයි /ඉදිරිපත් කරයි.
- අවිධිමත් භූමි පරිහරණය නිසා ඇතිවන ගැටලු විස්තර කරයි.
- භූමිය නිසි පරිදි භාවිත කළ යුතු බව ප්‍රකාශ කරයි.
- ජල සම්පතෙහි වටිනාකම අගය කරති /ප්‍රකාශ කරයි.
- පානීය ජලය තිරසර ව භාවිත කළ යුතු බව කියයි.
- ජල මූලාශ්‍රය නම් කරයි.
- ජල මූලාශ්‍රයවල ප්‍රයෝජන ඉදිරිපත් කරයි.
- ජල මූලාශ්‍රය රැකගතයුතු බවට ප්‍රකාශ කරයි.
- ජල දූෂණය වළක්වා ගතහැකි ක්‍රම විස්තර කරයි.
- වායුව දූෂණය වන ක්‍රම විස්තර කරයි.
- වායු දූෂණය වළක්වා ගතහැකි ක්‍රම විස්තර කරයි.
- බලශක්තිය ප්‍රයෝජනයට ගන්නා අවස්ථා කියයි.
- බලශක්තිය අරපිරිමැස්මෙන් භාවිත කළ යුතු ආකාරය විස්තර කරයි.
- නිර්මාණශීලී ව හා ක්‍රමානුකූල ව බිත්ති පුවත් පත ඉදිරිපත් කරයි.
- ජල සම්පතෙහි සහයෝගයෙන් කටයුතු කරයි.

| | | | |
|---|---|---|---|
| 1. | **නිපුණතාව** | : | භෞතික හා මානුෂ භූ දර්ශනය සංරක්ෂණය කිරීමට හා පවත්වා ගැනීමට උපකාරී වන ධනාත්මක ආකල්ප සහිත ව සංවේදී ව හැසිරෙයි. |
| 2. | **නිපුණතා මට්ටම** | : | **6.3.2 ප්‍රයෝජනවත් ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමෝපායන් අනුගමනය කරයි.** |
| 3. | **කාලච්ඡේද** | : | 04 |
| 4. | **ඉගෙනුම් පල** | : | • ගෘහස්ථ, කාර්මික හා කෘෂිකාර්මික අපද්‍රව්‍ය යන ඒවා පැහැදිලි කරයි.<br>• නිවසේ ඇති අපද්‍රව්‍ය දෙන ලද වර්ගීකරණයකට අනුව වර්ග කර දක්වයි.<br>• අපද්‍රව්‍ය බැහැර කිරීමේ නිවැරදි ක්‍රම දැන ප්‍රකාශ කරයි.<br>• අපද්‍රව්‍ය අනිසි ලෙස බැහැර කිරීමෙන් පරිසරයට සිදු වන හානි විස්තර කරයි.<br>• අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීමේ ප්‍රයෝජන පැහැදිලි කරයි.<br>• අපද්‍රව්‍ය සම්පතක් ලෙස භාවිත කරන ආකාරය විස්තර කරයි. |

5. **විෂය අන්තර්ගතය**

නිවස හා අවට පරිසරය යහපත් ව පවත්වා ගැනීම සඳහා එදිනෙදා කටයුතුවල දී නිවසෙහි එකතු වන අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීම අත්‍යවශ්‍ය කරුණකි. එහෙත් අද මෙය බොහෝ නිවෙස්වල ප්‍රබල ගැටලුවක් බවට පත් ව ඇත. මෙම ගැටලුවට විසඳුම් සෙවීමේ දී වැඩිහිටියන් මෙන් ම සිසුන් තුළ ද ඒ පිළිබඳ ව අවබෝධයක් ඇති කිරීම අත්‍යවශ්‍ය ය. එබැවින් කුඩා කල සිට ම තම නිවස හා අවට පරිසරය පිරිසිදුව තබා ගැනීමේ හුරුව සිසුන්ට ලබා දීම ඉතා වැදගත් වේ.

ඒ අනුව එදිනෙදා කටයුතුවල දී නිවසින් බැහැර කරන විවිධ අපද්‍රව්‍ය පරිසරයට මුදාහැරීම නිසා සිදු වන හානියත්, ඒවා නිසි පරිදි කළමනාකරණය කර බැහැර කිරීමෙන් ඇති වන වැදගත්කම පිළිබඳ ව අවබෝධයක් සිසුන්ට ලබා දීමත් අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ දැනුමක් ලබා දීමත් මෙම ඒකකය ඉගැන්වීමෙන් අපේක්ෂා කෙරේ.

අපද්‍රව්‍ය බැහැර කිරීම

* ගෘහස්ථ අපද්‍රව්‍ය
* කෘෂිකාර්මික අපද්‍රව්‍ය
* කාර්මික අපද්‍රව්‍ය
* අක්‍රමවත් ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීමෙන් සිදු වන හානි
* අපද්‍රව්‍ය සම්පතක් ලෙස භාවිතය
* පරිසරයට හානියක් නොවන පරිදි බැහැර කිරීම

ගෘහස්ථ අපද්‍රව්‍ය යනු නිවසින් බැහැර කරන සියලු ම අපද්‍රව්‍යය. කෘෂිකාර්මික අපද්‍රව්‍ය යනු වගාබිම්, ගොවිපළ ආශ්‍රිත ව බැහැරලන අපද්‍රව්‍යය. කාර්මික අපද්‍රව්‍ය යනු කර්මාන්තශාලා

ආශ්‍රිත සහ කාර්මික නිෂ්පාදන ආශ්‍රිත අපද්‍රව්‍යය. ගෘහස්ථ අපද්‍රව්‍ය තුළ කාර්මික හා කෘෂිකාර්මික අපද්‍රව්‍ය ද තිබිය හැකි ය.

මෙම ක්‍රියාකාරකම මගින් වැඩි අවධානයක් යොමු කෙරෙනුයේ ගෘහස්ථ අපද්‍රව්‍ය පිළිබඳ ව ය. කාර්මික හා කෘෂිකාර්මික අපද්‍රව්‍ය පිළිබඳ ව ද අවධානයක් යොමුකර ක්‍රියාකාරකමක් සකස් කර ගත හැකි ය.

අපද්‍රව්‍ය දිරාපත් වන, දිරාපත් නො වන ලෙස වර්ග කිරීමට හා දිරාපත් නොවන අපද්‍රව්‍ය තවදුරටත් වර්ග කර හඳුනා ගත හැකි වන පරිදි ක්‍රියාකාරකමක් සැලසුම් කරන්න.

6. **ගුණාත්මක යෙදවුම්** :

පෙළ පොත්, පත්‍රිකා, රූපසටහන්

7. **තක්සේරුව හා ඇගයීම** :

සැලසුම් කරන ලද ක්‍රියාකාරී පාඩමට අදාළ ව පහත සඳහන් නිර්ණායක පහක් තෝරාගෙන ලකුණු පවරන්න.

- අපද්‍රව්‍ය අර්ථ දක්වයි.
- අපද්‍රව්‍ය වර්ග කරයි.
- ගෘහස්ථ අපද්‍රව්‍ය වර්ගකර දක්වයි.
- අපද්‍රව්‍ය බැහැර කිරීමේ නිවැරදි ක්‍රම ප්‍රකාශ කරයි.
- පාසල තුළ අපද්‍රව්‍ය නිසිලෙස බැහැර කරයි.
- අපද්‍රව්‍ය අවිධිමත් ලෙස බැහැර කිරීමේ ප්‍රතිඵල ප්‍රකාශ කරයි.
- අපද්‍රව්‍ය ප්‍රයෝජනට ගත හැකි ආකාරය ප්‍රකාශ කරයි.

## ඒකකය 6.4 : ශ්‍රී ලංකාවේ පිහිටීම

1. **නිපුණතාව** : භෞතික හා මානුෂ භූ දර්ශන තේරුම් ගැනීමට උපකාරී වන මූලික සංකල්ප හා ක්‍රමවේද විමර්ශනය කරයි.

2. **නිපුණතා මට්ටම** : 6.4.1 **ලෝක සිතියම් ඇසුරින් ශ්‍රී ලංකාවේ පිහිටීම හඳුනාගෙන එහි ස්වභාවය විස්තර කරයි.**

   6.4.2 ශ්‍රී ලංකාවේ ආර්ථික වශයෙන් වැදගත් ස්ථාන කිහිපයක පිහිටීම සිතියමකින් හඳුනා ගනියි.

   6.4.3 ශ්‍රී ලංකාව ලෝකයේ වෙනත් දූපත්වල විශාලත්වය අනුව සසඳයි.

3. **කාලච්ඡේද** : 12

4. **ඉගෙනුම් පල** :
   - ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරය මධ්‍යයේ සුවිශේෂ ස්ථානයක පිහිටා ඇති බවට තොරතුරු ඉදිරිපත් කරයි.
   - දූපතක් යනු කුමක් දැ යි අර්ථකථනය කරයි.
   - ඉන්දියන් සාගරය තුළ අනෙකුත් රටවලට සාපේක්ෂ ව ශ්‍රී ලංකාවේ පිහිටීම සිතියමක් ඇසුරින් විස්තර කරයි.
   - දූපත්වල විශාලත්වය අනුව දූපත් වර්ග කරයි.
   - ශ්‍රී ලංකාව ඇතුළු දූපත් කිහිපයක් ලෝක ආකෘති සිතියමක ලකුණු කොට නම් කරයි.
   - ශ්‍රී ලංකාවේ ආර්ථික වශයෙන් වැදගත්වන ස්ථාන කිහිපයක් හඳුනාගෙන සිතියමක ලකුණු කර නම් කරයි.

5. **විෂය අන්තර්ගතය**

භූගෝල විද්‍යාව ඉගෙන ගන්නා සෑම දරුවෙකු ම ශ්‍රී ලාංකිකයකු ලෙස, පෘථිවිතලය තුළ ශ්‍රී ලංකාවේ නිවැරදි ස්ථානගත වීම හා එහි ස්වභාවය පිළිබඳව යම් අවබෝධයක් ලබාගැනීම අත්‍යවශ්‍ය වේ. විශේෂයෙන් ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ මධ්‍යගත ව පිහිටි දූපතක් වේ. එහි පිහිටීමේ සුවිශේෂත්වය මත ලෝකයේ ඕනෑ ම ස්ථානයකට පහසුවෙන් ප්‍රවේශ වීමේ හැකියාව ඇති බව ද සිසුන්ට අවබෝධ කරදීම ද තවත් එක් අපේක්ෂාවකි.

ලෝක ආකෘති සිතියමක් තුළ හෝ ආදර්ශ ගෝලය තුළ හෝ ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම හඳුනාගැනීම, ශ්‍රී ලංකාවේ හැඩය හා ප්‍රමාණය සිසුවාට පහසුවෙන් අවබෝධ කර දීම ද තවත් එක් අපේක්ෂාවකි.

තවද විවිධ භූ විෂමතා ලක්ෂණ, යෝග්‍ය දේශගුණය, සොබා සෞන්දර්යය, ස්වාභාවික සම්පත්, ජෛව විවිධත්වය ආදිය නිසා මෙම දූපතට ලෝකවාසීන්ගේ උනන්දුව ඇත අතීතයේ

පටන් ම පැවතුණි. ඒ සියලු වැදගත්කම් හිමිවන්නේ මෙම ද්වීපයේ ස්වභාවය හා ස්ථානගත වීම අනුව යි. ලෝකයේ තවත් ද්වීපත් කිහිපයක් සමග එහි ප්‍රමාණය හා හැඩය සන්සන්දනය කර මධ්‍ය ප්‍රමාණයේ ද්වීපයක් බව අවබෝධ කර ගැනීමත්, එහි සාපේක්ෂ පිහිටීම හඳුනා ගැනීමටත්, අවශ්‍ය ඉගෙනුම් ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ. පාසල් බොහෝමයක පරිගණක භාවිතය සතුටුදායක බැවින් පරිගණක ඇසුරින් සිතියම් පරිශීලනය කළ හැකි ය. විශේෂයෙන් ම ශ්‍රී ලංකාවේ පිහිටීම දැක්වෙන පරිගණක සිතියම් ලබාගෙන ඒවා සිසුන්ට නිරීක්ෂණය කිරීමට අවස්ථාව ලබා දීම වඩාත් යෝග්‍ය ය.

ශ්‍රී ලංකාව තුළ ආර්ථික වශයෙන් වැදගත් වන ස්ථාන රාශියක් වර්තමානය වනවිට සංවර්ධනය වී ඇත. එයින් තෝරාගත් වැදගත් ස්ථාන කිහිපයක පිහිටීම ශ්‍රී ලංකා සිතියමක හඳුනා ගැනීම මෙයින් අපේක්ෂා කරයි. ඒ අතර ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපළ, වරාය, ප්‍රධාන නාගරික පරිසර හා අධිවේගී මාර්ග ප්‍රධාන පිවිසුම් ස්ථාන කෙරෙහි වැඩි අවධානයක් මෙහි දී යොමු කෙරේ. තවද ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී දිවයිනේ සියලු ම පළාත් නියෝජනය වන පරිදි රට තුළ කැපී පෙනෙන සංවර්ධන කටයුතු පිළිබඳ සාකච්ඡා කරන්න.

- ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම හඳුනා ගැනීම සඳහා කේවල ක්‍රියාකාරකමක්
- ශ්‍රී ලංකාව හා නිර්දේශ කරන ලද ද්වීපත් හඳුනා ගැනීම සඳහා කණ්ඩායම් හෝ කේවල පැවරුමක් සකසා ගන්න.
- ශ්‍රී ලංකාවේ පළාත් වෙන් කරන ලද සිතියමක තෝරාගන්නා ලද ආර්ථික වශයෙන් වැදගත් වන ස්ථාන ලකුණු කිරීම හා ඒවාට අදාළ ඡායාරූප සිතියම ආසන්නයේ ඇලවීම මඟින් ඉගෙනුම් පුවරුවක් නිර්මාණය කිරීම සඳහා ක්‍රියාකාරකමක් සැලසුම් කරන්න.

**6. ගුණාත්මක යෙදවුම් :**

රූප හා පින්තූර, ලංකා /ලෝක සිතියම්, වීඩියෝ පට, පෙළ පොත

**7. තක්සේරුව හා ඇගයීම :**

සැලසුම් කරන ලද පාඩමට පහත සඳහන් නිර්ණායක අතුරින් පහක් තෝරා ගෙන ලකුණු පවරන්න.

- ලෝක ගෝලය / ලෝක සිතියමට නිරීක්ෂණය කර ශ්‍රී ලංකාවේ පිහිටීම දක්වයි.
- ලෝක සිතියම් තුළ ශ්‍රී ලංකාවේ පිහිටීම ලකුණු කර නම් කරයි.
- ද්වීපත යන්න නිවැරදි ව අර්ථ දක්වයි.
- ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම විස්තර කරයි.
- ලෝක සිතියමක ද්වීපත් ලකුණු කර නම් කරයි.
- විශාලත්වය අනුව ද්වීපත් වර්ගකර දක්වයි.
- ශ්‍රී ලංකාවේ ආර්ථික වශයෙන් වැදගත් ස්ථාන නම් කර ලකුණු කරයි.

## විවිධ සහාය

| | |
|---|---|
| **පරිගණක වදන් සැකසුම:** | ඩබ්ලිව්.එම්. ධම්මිකා මිය<br>ඒ. එල්. එස්. පී. අතපත්තු මෙවිය<br>සිම්ස්කා සුසිකෝ ජයවර්ධන මිය |
| **පිටකවරය :** | රවීන්ද්‍ර තේනුවර මයා<br>කථිකාචාර්ය<br>සෞන්දර්ය දෙපාර්තමේන්තුව |
| **විවිධ සහාය :** | පියතිලක ප්‍රනාන්දු මයා<br>ආර්. එම්. රූපසිංහ මයා |